සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2023 (2024)
# கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தரப் பரீட்சை, 2023 (2024)
# General Certificate of Education (Adv. Level) Examination, 2023 (2024)

නර්තනය - (දේශීය) I
நடனம் - (தேசிய) I
Dancing - (Indigenous) I

**52 S I**

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

විභාග අංකය : ...............................................

පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා

| පිටු අංකය | ප්‍රශ්න අංක | ලකුණු |
|---|---|---|
| 01 | 01 - 04 | |
| 02 | 05 - 13 | |
| 03 | 14 - 23 | |
| 04 | 24 - 35 | |
| 05 | 36 - 44 | |
| 06 | 45 - 50 | |
| එකතුව | | |

| | අවසාන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂක | | |
| 2 වන පරීක්ෂක | | |
| අධි/ප්‍රධාන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |

**උපදෙස්:**
* ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සැපයිය යුතු ය.
* එක් ප්‍රශ්නයකට ලකුණු **02** බැගින් මුළු ලකුණු **100** කි.

● අංක **01** සිට **25** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී නිවැරදි හෝ වඩාත් ම ගැළපෙන හෝ පිළිතුර තෝරා, එට අදාළ **අංකය** ප්‍රශ්නය ඉදිරියෙහි ඇති **වරහන තුළ ලියන්න.**

1. ඔබ උගත් සම්ප්‍රදායට අනුව තෙයිකිට තෙයි තාම්/ තෙයි කිට තෙයි තා/ තෙයි තක යන පා සරඹය හෝ මණ්ඩි පදය හෝ අයත් වන්නේ,
   (1) දෙවන පා සරඹයට/මණ්ඩි පදයට ය.
   (2) තෙවන පා සරඹයට/මණ්ඩි පදයට ය.
   (3) පස්වන පා සරඹයට/මණ්ඩි පදයට ය.
   (4) සයවන පා සරඹයට/මණ්ඩි පදයට ය.
   (5) එකොළොස්වන පා සරඹයට/මණ්ඩි පදයට ය. (.........)

2. දේශීය නර්තනයට අදාළ පැනීම් සහ කැරකීම් පුහුණු කිරීම මගින්
   (1) භාව ප්‍රකාශනය, රස ජනනය සහ නිවැරදි අංගහාර සංවර්ධනය කරයි.
   (2) මණ්ඩිය, අංගහාර සහ භාව ප්‍රකාශනය වර්ධනය කරයි.
   (3) සමබරතාව, පාද හැසිරවීම සහ අවකාශ භාවිතය හුරු කරයි.
   (4) ශරීර නම්‍යතාව, මණ්ඩිය සහ තාල අවබෝධය වැඩි දියුණු කරයි.
   (5) මණ්ඩිය, තාල අවබෝධය සහ භාව ප්‍රකාශනය හුරු කරයි. (.........)

3. ගජගා වන්නම/ සෙබළුවෙච්චි තාලය/ අටකුරු ගණක වන්නම නර්තනය කරනු ලබන්නේ,
   (1) සුළු තනිතිතට ය.
   (2) මැදුම් තනිතිතට ය.
   (3) මහ තනිතිතට ය.
   (4) මැදුම් මහ දෙතිතට ය.
   (5) සුළු මහ දෙතිතට ය. (.........)

4. තම්මැට්ටම සහ උඩැක්කිය සඳහා භාවිත කළ හැකි අවශේෂ නාම පිළිවෙළින් සඳහන් වරණය තෝරන්න.
   (1) කුණ්ඩලම්පල්ල සහ ඩැක්කිය
   (2) දෑත හරි බෙරය සහ තියද කෙඳි බෙරය
   (3) දෙමු බෙරය සහ සිරිවසය
   (4) පොකුරු බෙරය සහ කිඳුරු බෙරය
   (5) පොකුරු බෙරය සහ සිරිවසය (.........)

5. රස සිද්ධාන්තය පිළිබඳව සාහිත්‍ය විවරණයෙන් ඉදිරිපත් කරන ලද පෙරදිග පඬිවරුන් වන්නේ,
(1) භරතමුනි, නන්දිකේශ්වර සහ වල්ලතෝල් නාරායන් ය.
(2) භරතමුනි, නන්දිකේශ්වර සහ ඇරිස්ටෝටල් ය.
(3) ආනන්දවර්ධන, අභිනවගුප්ත සහ නන්දිකේශ්වර ය.
(4) ආනන්දවර්ධන, නන්දිකේශ්වර සහ ඇරිස්ටෝටල් ය.
(5) ජගල්වෝ, සොක්‍රටීස් සහ අභිනවගුප්ත ය. (.........)

6. "රූපයක් ඇති මුහුණු සයකින් අත් දොළසකින් බබුළුවාගෙන" මෙම කවිය,
(1) නමස්කාරයකි.
(2) සුවිසි විවරණ කවියකි.
(3) තුළුවෙන් කවියකි.
(4) වරම කවියකි.
(5) සිරසපාද කවියකි. (.........)

7. කෝට්ටේ යුගයේ පිරිවෙන් අධ්‍යාපනයට නාට්‍ය කලාව ඇතුළත් වූ බවට තොරතුරු ලබා ගත හැක්කේ,
(1) සුනේත්‍රාදේවී පිරිවෙන සහ විද්‍යාලංකාර පිරිවෙන ඇසුරෙනි.
(2) තොටගමුවේ විජයබා පිරිවෙන සහ කැරගල පද්මාවතී පිරිවෙන ඇසුරෙනි.
(3) තොටගමුවේ විජයබා පිරිවෙන සහ විද්‍යාලංකාර පිරිවෙන ඇසුරෙනි.
(4) විදාගම විද්‍යෝදය පිරිවෙන සහ කැරගල පද්මාවතී පිරිවෙන ඇසුරෙනි.
(5) විද්‍යෝදය පිරිවෙන සහ තොටගමුවේ විජයබා පිරිවෙන ඇසුරෙනි. (.........)

8. ප්‍රශස්ති කාව්‍ය පිළිබඳ වඩාත් නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) මහනුවර යුගයේ ලියැවුණු පැරකුම්බා සිරිත මුල් ම ප්‍රශස්ති කාව්‍යයයි.
(2) චන්දිභට්ටයින් විසින් ගායනය කළ අතර දෙවියන් පමණක් වර්ණනා කෙරේ.
(3) කෝට්ටේ යුගයේ බිහි වී මහනුවර යුගයේ දී දියුණු විය.
(4) අතිශයෝක්ති වර්ණනා බහුල අතර යුධ අවස්ථාවන්හි දී භාවිත කෙරිණි.
(5) කෝට්ටේ යුගයේ බිහි වූ අතිශයෝක්ති වර්ණනාවලින් තොර ගායන විශේෂයකි. (.........)

9. "තිරිහතොණ යුතා මල් මල් සුවදැති ..." මෙම කවියෙන් කියැවෙන්නේ කුමන ග්‍රහයා පිළිබඳව ද?
(1) ශනි ග්‍රහයා
(2) කෙතෙතු ග්‍රහයා
(3) සිකුරු ග්‍රහයා
(4) බුද ග්‍රහයා
(5) රාහු ග්‍රහයා (.........)

10. පුහුන බලිය සහ කඨිනා බලිය යන බලි මෙයාදාගනු ලබන්නේ,
(1) ගැබිනි මව්වරුන් සඳහා ය.
(2) වර්ෂාව ලබා ගැනීම සඳහා ය.
(3) නවග්‍රහ අපල දුරු කර ගැනීමට ය.
(4) උපසම්පදා පිංකම් අවසානයේ දී ය.
(5) කඨින උත්සව අවසානයේ දී ය. (.........)

11. වලියක් මංගල්‍යයේ පුරාවෘත්තය හා බැඳි චරිත වන්නේ,
(1) විෂ්ණු දෙවියන්, සීතා බිසව සහ කුවේණිය ය.
(2) මල රජකුන්තවවුව, කුවේණිය සහ රාම කුමරු ය.
(3) මල රජකුන්තවවුව, සීතා බිසව සහ විජය කුමරු ය.
(4) විජය කුමරු, පත්තිනි දේවිය සහ පාලඟ කුමරු ය.
(5) මල රජකුන්තවවුව, පත්තිනි දේවිය සහ පාලඟ කුමරු ය. (.........)

12. රත් පැහැය සහ නිල් පැහැය හිමි ග්‍රහයින් පිළිවෙළින් සඳහන් වරණය කුමක් ද?
(1) ගුරු සහ කේතු
(2) අඟහරු සහ ගුරු
(3) සෙනසුරු සහ කේතු
(4) ගුරු සහ සෙනසුරු
(5) කේතු සහ ඉරු (.........)

13. මාත්‍රා පහක තාල ලක්ෂණය පෙන්නුම් කරන දේශීය, කර්ණාටක සහ හින්දුස්ථානි තාලරූප පිළිවෙළින් ඇක්වෙන වරණය තෝරන්න.
(1) පංචතාලය, ඛණ්ඩජාති ඒකතාලය සහ ජප් තාලය
(2) සුළු මැදුම් දෙතිත, ජප් තාලය සහ ඛණ්ඩජාති ඒකතාලය
(3) සුළු මැදුම් දෙතිත, ඛණ්ඩජාති ඒකතාලය සහ ජප් තාලය
(4) සුළු මැදුම් දෙතිත, මිශ්‍රජාති ඒකතාලය සහ දීප්චන්දි තාලය
(5) පංච තාලය, මිශ්‍ර චාපු තාලය සහ ජප් තාලය (.........)

14. කොහොල් මඩුව උපහාසයකි කරගනිමින් කවි කවුවකින් හෝ කවිඩු සිහිපයකින් හෝ ප්‍රස්තාව නිම කෙරෙන ශාන්තිකර්ම සැංගිල්ල කුමක් ද?
(1) ගෙලේ ගෙඩිය (2) මල් යහන (3) පේනඩි
(4) මල් බලිය (5) මල් මුලන්තැටුව (.........)

15. සැලු ඥානය සහ සිංහල නර්තන කලාව යන කෘති රචනා කරන ලද්දේ පිළිවෙළින්,
(1) වින්සන්ට් සෝමපාල සහ මුදියන්සේ දිසානායක ය.
(2) සරත් විජේවර්ධන සහ මුදියන්සේ දිසානායක ය.
(3) ජේ. ඊ. සෙදරමන් සහ වින්සන්ට් සෝමපාල ය.
(4) වින්සන්ට් සෝමපාල සහ ජේ. ඊ. සෙදරමන් ය.
(5) මුදියන්සේ දිසානායක සහ තිස්ස කාරියවසම් ය. (.........)

16. කුලීනයන් අතර පැවති බටහිර බැලේ රංග කලාව පොදු ජනයා අතර ව්‍යාප්ත කිරීමට මුල් වූයේ
(1) ජීන් බැප්ටිස් ලිලි ය. (2) ඇනා පව්ලෝවා ය.
(3) ජීන් ජෝර්ජ් නොවෙර් ය. (4) 14 වන ලුවී රජු ය.
(5) කැතරින් ඩි. මෙඩිසි ය. (.........)

17. ගම්පොළ යුගයේ දී ලියැවුණු මයුර සංදේශයේ දෙවුන්දර උපුල්වන් දේවාලයෙහි පැවති නර්තන පිළිබඳ දැක්වෙන කවි පදය කුමක් ද?
(1) රූ රැසේ අඳිනා ලෙසේ අත් ලෙළ දිදී විදුලිය පමා
(2) විඳෙන ලෙලෙන සරු බර පුළුලුකුල රඳී
(3) රළලා උපුලා ලෙලුම් කුලායා
(4) ලෙලවන දිළ සෙන සිලුපුල සේයා
(5) අඳිමින් සුදු පට සළු ගෙළ සඳුනෙන් ඇඳු නවරා (.........)

18. වන්නම් සාහිත්‍යය පිළිබඳ විමසීමේ දී විදග්ධ කාව්‍ය ලක්ෂණ සහිතව රචනා වී ඇතැයි සැලකෙන්නේ,
(1) උඩරට වන්නම් ය. (2) පහතරට සින්දු වන්නම් ය.
(3) සබරගමු වන්නම් ය. (4) අද්‍යතන වන්නම් ය.
(5) අප්‍රචලිත වන්නම් ය. (.........)

19. ආලෝකකරණයේදී විස්මය සහ අද්භූත බව මතු කිරීම සඳහා වඩාත් සුදුසු පහන් (lamp) වර්ගය වන්නේ මින් කුමක් ද?
(1) ඩිමර් (Dimmer)
(2) ස්පොට් ලයිට් (Spot Light)
(3) ෆලෝව් ස්පොට් ලයිට් (Follow Spot Light)
(4) ෆ්ලඩ් ලයිට් (Flood Light)
(5) අල්ට්‍රා වයලට් ලැම්ප් (Ultra Violet Lamp) (.........)

20. තිස් දශකයේ දී විධිමත් නර්තන අධ්‍යාපනයට ප්‍රවේශයක් ලබා දුන් ආයතනයක් සහ අධ්‍යාපනඥයෙක් වන්නේ,
(1) හොරණ ශ්‍රීපාලිය සහ එස්. එල්. බී. කපුකොටුව ය.
(2) හොරණ ශ්‍රීපාලිය සහ ජේ. ඩී. ඒ. පෙරේරා ය.
(3) හේවුඩ් ආයතනය සහ විල්මට් ඒ. පෙරේරා ය.
(4) ගාන්ධර්ව සභාව සහ ජේ. ඩී. ඒ. පෙරේරා ය.
(5) හේවුඩ් ආයතනය සහ එස්. පණිභාරත ය. (.........)

21. සන්නි යකුගේ උත්පත්තිය කුමන රාජ පරම්පරාවක් හා සම්බන්ධවේ ද?
(1) මහා සම්මත රාජ පරම්පරාව (2) කාලාශෝක රාජ පරම්පරාව
(3) ආර්ය වංශය (4) ලිච්ඡවී රාජ පරම්පරාව
(5) ශාක්‍ය වංශය (.........)

22. ශාන්තිකර්මයක, එක් නාට්‍යමය පෙළපාළියක් තුළ හාස්‍ය චරිත කිහිපයක් නිරූපණය කෙරෙනුයේ,
(1) සුනියම් ශාන්තිකර්මයේ දී ය. (2) සන්නි යකුමේ දී ය.
(3) මහ සොහොන් සමයමේ දී ය. (4) කඩවර කංකාරියේ දී ය.
(5) කපුයක්කාරියේ දී ය. (.........)


23. කාන්තා ගණයට ගැනෙන 'අලාරිප්පු' අයත් නර්තන සම්ප්‍රදාය කුමක් ද?
(1) මනිපුරි (2) කථකලි
(3) මෝහිනී ආට්ටම් (4) කථක්
(5) භරත නාට්‍යම් (.........)

24. "බැරිසිල්" මුද්‍රා නාට්‍යයේ කාන්තා චරිත නිරූපණය කිරීම සඳහා කෝලම් නාට්‍යය ඇසුරෙන් යොදා ගන්නා ලද බෙර පදය වන්නේ,

(1) දිත් තම් දිතකු දොම් දොම් තාම් ය.
(2) ගුං දැහිං ගුඳ ගුඳ දැහිං ය.
(3) දොංත ගතං දොංත ගතිගතං ය.
(4) දොම් ගතිකිට දොම් දිමි ගතිකිට ය.
(5) ගත ගුම් ජිමිගත ගදිගත ගදිත ගතම් ය. (.........)

25. පහත A, B සහ C රූප සටහන් මගින් දැක්වෙන චරිත අනුපිළිවෙළින් සඳහන් කර ඇති වරණය කුමක් ද?


A


B


C

(1) පොලිස්, වෙදරාළ, සොකරි
(2) හෙන්වා, වෙදරාළ, නොන්චි
(3) ජස, ආරච්චි, කලස්පාලිය
(4) පොලිස්, ජස, නොන්චි
(5) පොලිස්, හෙන්වා, නොන්චි (.........)

● අංක 26 සිට 35 තෙක් දී ඇති එක් එක් වාක්‍යයේ හිස්තැනට වඩාත් සුදුසු වචන/වචනය යොදන්න.

26. රිද්දි යාගයේ දී අවගනාංව මත අභිනය වූ ......................... බලිය සුවිශේෂ සැරසිල්ලකි.

27. ශ්‍රී ලංකාවේ සංගීත භාණ්ඩ පිළිබඳ ප්‍රථම වර්ගීකරණය හමුවන්නේ මහාවංශයට ලියන ලද ටීකාවක් වූ ......................... මූලාශ්‍රයෙනි.

28. අටමඟල වෙනුවට වලියක් මංගල්‍යයේ දී අඳිනු ලබන සැරසිල්ල ......................... යන පාරිභාෂික නාමයෙන් හඳුන්වනු ලැබේ.

29. කෘෂිකාර්මික ජන ජීවිතයෙහි ගවයාට ඇති වැදගත්කම ......................... ශාන්තිකර්මයේ අරමුණු විමසීමේ දී පැහැදිලි වේ.

30. නිශ්චිත කාල රූපයක වේගය ......................... මානය ලෙස සම්ප්‍රදායේ භාවිත වේ.

31. ගැටබෙර වාදනය කිරීමේ ශිල්ප ක්‍රමයක් වන දඬිදොඬිය, ......................... යන නමින් ද හැඳින්වේ.

32. සත්පත්තිනි, දිව්‍යමංගලිකා සහ කෝච්චිය යන මුද්‍රා නාට්‍ය ......................... විසින් නිර්මාණය කර තිබේ.

33. මගේ කාරිය මම පැලපොල් සිටුවනවා
උගේ කාරිය ඌ පැලපොල් වනසනවා

මෙම කවිය ......................... නාට්‍යමය පෙළපාළියට අයත් වේ.

34. "තෝත්තමාලය" දකුණු ඉන්දියාවේ සිට මෙහි පැමිණි ......................... විසින් ලියන ලද්දකැයි වත්තම් ඉතිහාසයෙහි සඳහන් වේ.

35. නර්තනයේ දී ශරීරය කේන්ද්‍ර කොටගත් සම්පූර්ණ දිශා ගණන ......................... කි.

- අංක 36 සිට 50 තෙක් ප්‍රශ්නවලට අදාළ පිළිතුරු තිත් ඉර මත ලියන්න.

36. දේශීය තාල පද්ධතිය පිළිබඳ 1962 දී පළ වූ කෘතිය සහ එහි රචකයා නම් කරන්න.

(i) කෘතිය : ..............................................

(ii) රචකයා : ..............................................

37. කොහොඹා යක්-කංකාරියේ දී ඉදිරිපත් කෙරෙන යාදිනි දෙකක් නම් කරන්න.

(i) ..............................................

(ii) ..............................................

38. දෙවොල් දෙවියන් ලක්දිවට පැමිණි හැටි තුළ ගෙන නිරූපණය කිරීම සඳහා ඉදිකෙරෙන පැරකිල්ල සහ භාවිත ශාන්තිකර්මයක් නම් කරන්න.

(i) පැරකිල්ල : ..............................................

(ii) ශාන්තිකර්මය : ..............................................

39. වෙස් ඇඳුම් කට්ටලයෙහි අඳින රෙද්ද සහ පටිවටම හැඳීමේ සඳහා භාවිත පාරිභාෂික වචන මොනවා ද?

(i) අඳින රෙද්ද : ..............................................

(ii) පටිවටම : ..............................................

40. කඩයාම සහ නැල්ලුල්ලිය ගත පෙළපාළි අංග ඇතුළත් ශාන්තිකර්ම කවරේ ද?

(i) කඩයාම : ..............................................

(ii) නැල්ලුල්ලිය : ..............................................

41. පහතරට නැටුම් සම්ප්‍රදායේ භාවිත ආභරණ අතර අටවිසල් සහ සලංගෙයි පලඳිනු ලබන්නේ ශරීරයේ කිනම් ස්ථාන සඳහා ද?

(i) අටවිසල් : ..............................................

(ii) සලංගෙයි : ..............................................

42. දේශීය තාල පද්ධතියේ මැදුම් තනිතිතට සහ මැදුම් මහ දෙතිතට සමාන හින්දුස්ථානි තාල රූපය බැගින් නම් කරන්න.

(i) මැදුම් තනිතිත : ..............................................

(ii) මැදුම් මහ දෙතිත : ..............................................

43. නෘත්ත, නෘත්‍ය සහ නාට්‍ය වර්ගීකරණයට අනුව ධ්‍රමරි සහ තර්ජනා නර්තනාංග අයත් වන්නේ කවර ප්‍රවර්ගයට ද?

(i) ධ්‍රමරි : ..............................................

(ii) තර්ජනා : ..............................................

44. සෙබිහෙන් රාගවී සෙනෙහෙන් සහ දෙයාසෙන් ගීත නාටක නිර්මාණය කරන ලද්දේ කවුරුන් විසින් ද?

(i) සෙබිහෙන් රාගවී සෙනෙහෙන් ..............................................

(ii) දෙයාසෙන් ..............................................

45. ද්‍රවිඩ ජන නැටුම් ලෙස සැලකෙන පින්නල් කෝලාට්ටම් සහ අරවිපෙට්ටු නර්තන අංගයන්ට සමාන සිංහල ජන නැටුම් සඳහන් කරන්න.

(i) පින්නල් කෝලාට්ටම් : ..........................................

(ii) අරවිපෙට්ටු : ..........................................

46. ගී පැදියක අවසානයේ ඇදෙන මාත්‍රා හඳුන්වන නාමය සහ ඊට අදාළ සංකේතය නම් කරන්න.

(i) ඇදෙන මාත්‍රා නාමය : ..........................................

(ii) සංකේතය : ..........................................

47. පහත දැක්වෙන රූපයන්හි භාව නම් කරන්න.



A



B

(i) A භාවය : ..........................................

(ii) B භාවය : ..........................................

48. හෙන්වා (හෙංවජ්‍ර) නම් යක්ෂයා සමඟ සභාවට පිවිසෙන කෝලම් චරිතය සහ එමගින් උපදින රසය නම් කරන්න.

(i) චරිතය : ..........................................

(ii) රසය : ..........................................

49. "ඉණේ තවටි රන් කෙඳිවත්" මෙම කවි පාදය පුර මහ දෙකිත (2 + 4) තාලයට අනුව ගායනය කිරීමේ දී අයත්වන සඳැස් මත් සහ ගී මත් සංඛ්‍යාව ලියා දක්වන්න.

(i) සඳැස් මත් : ..........................................

(ii) ගී මත් : ..........................................

50. සිං හතරේ සහ මඩු පුරයේ කවි ගායනා කෙරෙන ශාන්තිකර්ම නම් කරන්න.

(i) සිං හතරේ කවි : ..........................................

(ii) මඩු පුරයේ කවි : ..........................................

❀ ❀ ❀

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2023(2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2023(2024)
General Certificate of Education (Adv. Level) Examination, 2023(2024)

නර්තනය - (දේශීය) II
நடனம் - (தேசிய) II
Dancing - (Indigenous) II

52 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

උපදෙස්:

* මෙම ප්‍රශ්න පත්‍රය I, II හා III වශයෙන් කොටස් **තුනකින්** සමන්විත වේ.
* I කොටසේ 1 හා 2 ප්‍රශ්න අනිවාර්ය වේ.
* II හා III කොටස්වලින් **අවම වශයෙන් එක්** ප්‍රශ්නය බැගින් තෝරාගෙන, අනිවාර්ය ප්‍රශ්න **දෙක** ද ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සැපයිය යුතු ය.
* සෑම ප්‍රශ්නයකම (i) කොටසට ලකුණු 06ක් ද (ii) කොටසට ලකුණු 06ක් ද (iii) කොටසට ලකුණු 08ක් ද වශයෙන් මුළු ලකුණු 20ක් බැගින් හිමි වේ.

## I කොටස

1. (i) පහත සඳහන් බෙර පද අතුරෙන් ඔබ උගත් සම්ප්‍රදායට අයත් බෙරපදය තෝරාගෙන සමගුණ සහ දෙගුණට ප්‍රස්තාර කරන්න.
   (අ) දොම්කිට කිට දොම් (ආ) ගරිගුද ගතකු දොම (ඉ) කිටිතක දොම්කිට

   (ii) පහත සඳහන් කවි පාදය අවග්‍රහයෙන් ආරම්භ කර මැදුම් තනිතිතට ප්‍රස්තාර කරන්න.
   "ධීර ගුණැති දීපංකර මුනි බුදු වෙමිනේ..."

   (iii) සුරපති වන්නමේ කස්තිරම හෝ ග්‍රහදණ්ඩ තාලය සින්දු වන්නමේ ඉරට්ටිය හෝ මෙස වන්නමේ අඩව්ව හෝ ප්‍රස්තාර කරන්න.

2. ශ්‍රී ලාංකේය නර්තන කලාව උදෙසා රාජ්‍ය අනුග්‍රහය ලැබී ඇති බව පුරාවිද්‍යා හා සාහිත්‍ය මූලාශ්‍රය මගින් හෙළි වේ.
   (i) දුටුගැමුණු රජතුමා ආගමික කටයුතු සඳහා නර්තනය සහ වාදනය සම්බන්ධ කරගත් බවට මහාවංශය සහ ථූපවංශය ඇසුරින් **එක්** සාධකය බැගින් ගෙන පැහැදිලි කරන්න.

   (ii) මහා පරාක්‍රමබාහු රජතුමා නෘත්‍ය, ගීත ආදී විනෝදාංග සඳහා ද අනුග්‍රහය දක්වා ඇති බව මූලාශ්‍රය **දෙකක්** ඇසුරින් විස්තර කරන්න.

   (iii) සිංහල සාහිත්‍යයේ ස්වර්ණමය යුගය ලෙස සැලකෙන කෝට්ටේ යුගයේ දී නර්තන කලාවට ද හිමිවූයේ ප්‍රමුඛස්ථානයකි. සාධක **හතරක්** ඇසුරින් සනාථ කරන්න.

## II කොටස

3. දේශීය ශාන්තිකර්ම මගින් සමාජ සහජීවනය සඳහා මෙන්ම මනෝ චිකිත්සනය සඳහා ද උපදේශන සපයයි.
   (i) බලි ශාන්තිකර්ම හා බැඳුණු සමාජ විශ්වාස **දෙකක්** පැහැදිලි කරන්න.

   (ii) ඌරා යක්කමෙන් සමාජ සහජීවනය සඳහා ලබාදෙන උපදේශන **දෙකක්** විමසුමට ලක් කරන්න.

   (iii) සන්නියකුම ශාන්තිකර්මයෙන් මනෝ චිකිත්සනය සිදුවන අයුරු සන්නි චරිතයක් සහ යක්ෂ චරිතයක් ඇසුරින් විග්‍රහ කරන්න.

4. දේශීය ශාන්තිකර්ම විවිධ අරමුණු සාක්ෂාත් කරගැනීම උදෙසා ගොඩනැගී ඇත.

(i) කිරිමඩුව ශාන්තිකර්මයෙහි පූජාවිධි **හතරක්** නම් කර, ඉන් **එකක්** විස්තර කරන්න.

(ii) වලියක් මංගල්‍යය ශාන්තිකර්මයට ආවේණික විශේෂතා **තුනක්** පැහැදිලි කරන්න.

(iii) රටයකුම් හෙවත් රිදී යාගයෙහි පෙළපාළි අංග **හතරක්** නම් කර උක්ත පියන භාවිත පෙළපාළි අංගයෙහි රංගභාණ්ඩ **දෙකක** උපයෝගීතාව විමසන්න.

5. ගැමි නැටුම් හා ගැමි නාටක මගින් සිංහල හා දෙමළ ජනතාවගේ සංස්කෘතික අනන්‍යතා ප්‍රකට කෙරේ.

(i) සවන් කලාව හා බැඳුණු සිංහල ගැමි නැටුමක් සහ ඊට සමාන ද්‍රවිඩ ගැමි නැටුමක් පිළිබඳ විස්තර කරන්න.

(ii) "දෙමළ ගැමි නර්තන, දේව භක්තිය ප්‍රකාශ කිරීම ප්‍රමුඛ කොටගෙන පවත්වනු ලැබේ." කාවඩි සහ කරගම් නර්තන ඇසුරෙන් විමසන්න.

(iii) මුදලි සහ ජස කෝලම් චරිත ඇසුරින් තත්කාලීන සිංහල ගැමි සමාජ සංයුතිය පිළිබඳ විග්‍රහ කරන්න.

## III කොටස

6. පහත වගුවෙහි (අ), (ආ) සහ (ඉ) යන කොටස් ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| (අ) කොටස | (ආ) කොටස | (ඉ) කොටස |
|---|---|---|
| පඛාවාජ් | ශිව රංග | හංසවිල |
| කෝල් බෙරය | බැරිසිල් | මැක්බත් |
| මෘදංගය | නලදමයන්ති | නිදි කුමරිය |
| ඩුං බෙරය | පට්ටුවාරා | නට් ක්‍රැකර් |

(i) (අ) කොටස - භරත නාට්‍යම් නර්තන සම්ප්‍රදායේ භාවිත තාල වාද්‍ය භාණ්ඩය තෝරාගෙන ඒ පිළිබඳ විස්තර කරන්න.

(ii) (ආ) කොටස - 2014 වර්ෂයේ නිෂ්පාදනය කළ දේශීය මුද්‍රා නාට්‍ය තෝරාගෙන එහි චරිත නිරූපණය පිළිබඳ විමසීමට ලක්කරන්න.

(iii) (ඉ) කොටස - 1890 වර්ෂයේදී ප්‍රථමවරට වේදිකාගත වූ බැලේ (Ballet) කෘතිය තෝරාගෙන එහි ප්‍රධාන කාන්තා චරිතය පිළිබඳ විමසන්න.

7. නර්තන කලාව සහ අනෙකුත් සෞන්දර්ය කලා අතර ඇති සහසම්බන්ධතාව නිර්මාණකරණයේ දී වැදගත් වේ.

(i) ප්‍රාසංගික නර්තන නිර්මාණ සඳහා සංගීතයෙන් ලැබෙන පිටිවහල පිළිබඳ සාකච්ඡා කරන්න.

(ii) නර්තන නිර්මාණකරණය සඳහා චිත්‍ර කලාවේ මූලිකාංග භාවිත කළ හැකි ආකාරය විමසුමට ලක් කරන්න.

(iii) බටහිර බැලේ සහ භාරත නාටකවල සම්මිශ්‍රිත සංගීතය සහ ඇඳුම් පැළඳුම් යන අංග ඇසුරෙන් ඇගයීමට ලක් කරන්න.

8. (i) රියැලිටි වේදිකාවේ ඉදිරිපත් කරන කණ්ඩායම් නර්තන මගින් දේශීය අනන්‍යතාව සුරැකේ ද? විමසන්න.

(ii) විසිඑක්වන සියවසේ ශ්‍රී ලාංකේය නර්තන කලාව කෙරෙහි කාන්තා දායකත්වය කෙබඳු ද? ඔබේ අදහස් දක්වන්න.

(iii) නූතන නර්තන කලාව පිළිබඳ විමසීමේ දී, දේශීය සංස්කෘතික ලක්ෂණ අභිබවා බටහිර සංකල්පීය ලක්ෂණ ස්ථාපිත වීම කෙරෙහි ජනමාධ්‍ය බලපා ඇත. විචාරය කරන්න.

* * *

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2023 (2024)

| විෂය අංකය<br>பாட இலக்கம் | 52 | විෂයය<br>பாடம் | නර්තනය (දේශීය) |
|---|---|---|---|

### ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்
### I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. |
|---|---|---|---|---|---|
| 01. | 1 | 11. | 5 | 21. | 4 |
| 02. | 3 | 12. | 4 | 22. | 2 |
| 03. | 3 | 13. | 3 | 23. | 5 |
| 04. | 5 | 14. | 1 | 24. | 3 |
| 05. | 3 | 15. | 1 | 25. | 4 |
| 06. | 4 | 16. | 3 | | |
| 07. | 2 | 17. | 3 | | |
| 08. | 3 | 18. | 2 | | |
| 09. | 5 | 19. | 5 | | |
| 10. | 2 | 20. | 1 | | |

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 02 ලකුණු බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 2 × 25 = 50

## I පත්‍රය

26. කළුකුමාර
27. වංසත්ථප්පකාසිනිය
28. සොළොස්මගල
29. සිරිමඩුව
30. ලය
31. ලකුඹුරුල
32. එස්. පණිභාරත
33. ඌරා යක්කම
34. ගණිතාලංකාර බමුණා
35. 10 (දහය)
36. I. හෙළ ගී මග — II. ඩබ්.බී. මකුලොලුව
37. I. ඌරා යක්කම — II. නයා යක්කම
38. I. කාලපන්දම් ගස — II. දෙවොල් මඩුව/ ගම් මඩුව/ පහන් මඩුව
39. I. උල්ලුඩය/ උල් උඩය/ නිසංසගල — II. පොත්පොට
40. I. දහඅටසන්නිය/ සන්නියකුම — II. රට යකුම/ රිද්දියාගය
41. I. කරට/ ගෙලට — II. පාද
42. I. දාදරා තාලය — II. දීප්චන්දි තාලය
43. I. නෘත්ත — II. නෘත්‍ය/නෘත
44. I. එදිරිවීර සරච්චන්ද්‍ර — II. ඩබ්.බී. මකුලොලුව
45. I. ලී මල්ලිය/ දිගරය — II. ගොයම්
46. I. ගුරු — II.
47. I. A - ක්‍රෝධය — II. B - ගම/ භක්ති
48. I. මුද්‍රා — II. වීර
49. I. 12 — II. 22
50. I. බලි — II. කොහොඹා කංකාරිය

*ප්‍රශ්න අංක 01 සිට 25 දක්වා (02 x 25) ලකුණු 50*

*ප්‍රශ්න අංක 26 සිට 50 දක්වා (02 x 25) ලකුණු 50*

*මුළු ලකුණු 100*

# I කොටස

1. (i) පහත සඳහන් බෙර පද අතුරෙන් ඔබ උගත් සම්ප්‍රදායට අයත් බෙරපදය තෝරාගෙන සමගුණ සහ දෙගුණට ප්‍රස්තාර කරන්න.

(අ) දොම්කිට කිට දොම් (ආ) රෙගුඳ ගතකු දොම් (ඉ) කිටිතක දොම්කිට

උඩරට

| | / | | | | / | | | | / | | | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 |
| සමගුණ | දො | මි | කි | ට | කි | ට | දොම් | - | දො | මි | කි | ට | කි | ට | දොම් | - |
| දෙගුණ | දොම් | කිට | කිට | දොම් | දොම් | කිට | කිට | දොම් | දොම් | කිට | කිට | දොම් | දොම් | කිට | කිට | දොම් |

නිවැරදි විභාගවලට වෙන් කිරීම හා සංකේත භාවිතයට ලකුණු 02

බෙර පදය නිවැරදිව ප්‍රස්තාර කිරීමට ලකුණු 04

මුළු ලකුණු 06

පහතරට

| | / | | | | / | | | | / | | | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 |
| සමගුණ | රෙ | ගු | ඳ | ග | ත | කු | දොම් | - | රෙ | ගු | ඳ | ග | ත | කු | දොම් | - |
| දෙගුණ | රෙගු | ඳග | තකු | දොම් | රෙගු | ඳග | තකු | දොම් | රෙගු | ඳග | තකු | දොම් | රෙගු | ඳග | තකු | දොම් |

නිවැරදි විභාගවලට වෙන් කිරීම හා සංකේත භාවිතයට ලකුණු 02

බෙර පදය නිවැරදිව ප්‍රස්තාර කිරීමට ලකුණු 04

මුළු ලකුණු 06

සබරගමු

| | / | | | | / | | | | / | | | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 |
| සමගුණ | කි | ටි | ත | ක | දො | මි | කි | ට | කි | ටි | ත | ක | දො | මි | කි | ට |
| දෙගුණ | කිටි | තක | දොම් | කිට | කිටි | තක | දොම් | කිට | කිටි | තක | දොම් | කිට | කිටි | තක | දොම් | කිට |

නිවැරදි විභාගවලට වෙන් කිරීම හා සංකේත භාවිතයට ලකුණු 02

බෙර පදය නිවැරදිව ප්‍රස්තාර කිරීමට ලකුණු 04

මුළු ලකුණු 06

පහතරට ග්‍රහදණ්ඩ තාලය - සින්දු වන්නමේ ඉරට්ටිය

| ^ | | | / | | | | ^ | | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 |
| දොම් | - | ග | දිත් | - | තත් | - | ග | දි | ත | ගුති | තිග | දිරි | කිට |
| දෙ | ග | ත | ගු | ද | ග | ත | ග | ත | කු | දොම් | - | ගති | ගත |
| දොම් | - | ත | දොම් | - | ග | ත | ග | දි | ත | ගුති | තිග | දිරි | කිට |
| තා | - | - | දොම් | - | ග | ත | ග | දි | ත | ගු | දි | ගු | ද |
| තා | | | | | | | | | | | | | |

*නිවැරදි විභාගවලට වෙන් කිරීම හා සංකේත භාවිතයට ලකුණු 02*

*නිවැරදිව ඉරට්ටිය ප්‍රස්තාර කිරීමට ලකුණු 06*

*මුළු ලකුණු 08*

සබරගමු මේස වන්නමේ අඩව්ව

| ^ | | | / | | | | ^ | | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 |
| ජිං | - | ත | ග | ත | ග | ත | ග | ති | ත | ග | ත | ග | ත |
| ග | ජිං | - | ගත් | - | තත් | - | ග | තත් | - | ජෙං | - | ජෙං | - |
| ග | තත් | - | කුං | - | දං | - | ග | තත් | - | කුං | - | දං | - |
| ග | තත් | - | කුං | - | දං | - | ග | තත් | - | කු | ද | කු | ද |
| දොං | - | ත | කුං | දත් | තරි | කිට | ග | තත් | - | කු | ද | ග | ත |
| තා | - | - | ගත් | - | තත් | - | ග | තත් | - | කු | ද | ග | ත |
| තා | | | | | | | | | | | | | |

*නිවැරදි විභාගවලට වෙන් කිරීම හා සංකේත භාවිතයට ලකුණු 02*

*නිවැරදිව අඩව්ව ප්‍රස්තාර කිරීමට ලකුණු 06*

*මුළු ලකුණු 08*

(iii) සිංහල සාහිත්‍යයේ ස්වර්ණමය යුගය ලෙස සැලකෙන කෝට්ටේ යුගයේ දී නර්තන කලාවට ද හිමිවූයේ ප්‍රමුඛස්ථානයකි. සාධක හතරක් ඇසුරින් සාකච්ඡා කරන්න.

- හයවන පැරකුම් රජුගේ රෝදුක් සහ සතුරු කරදර දුරුකිරීමට කොහොඹා කංකාරි ශාන්තිකර්මයක් කරවූ බව
- වීදාගම මෛත්‍රී හිමියන් විසින් බෞද්ධ මුහුණුවරකින් යුතුව දේශීය බලි ශාන්තිකර්මය මෙරට ස්ථාපිත කර වූ බව.
- තොටගමුවේ විජයබා පිරිවෙන, කැරගල පද්මාවතී වැනි පිරිවෙන් අධ්‍යාපන ආයතනවල පිළිගත් විෂයයක් ලෙස නාට්‍ය කලාව පැවති බව.
- හතරවන පරාක්‍රමබාහු රජතුමා වෙනුවෙන් සිංහල ප්‍රශස්ති කාව්‍යයක් ලෙස පිළිගැනෙන ''පැරකුම්බා සිරිත'' රචනා වී ඇති බව.
- පහත දැක්වෙන සංදේශ කාව්‍ය මගින් නර්තන කලාව පැවති තත්ත්වය හඳුනා ගත හැකි බව.

  උදා :

  - ලෙලවන දිගු නෙත...... (පරෙවි සංදේශය)
  - ලෙලදුන් නව තඹ පලුවන් පාදේ...... (පරෙවි සංදේශය)
  - අඳිමින් සුදුපට සළු ගෙල සඳුනෙන් තුනු තවරා....... (කෝකිල සංදේශය)
  - බරත සතර පෙර..... (සැවුල් සංදේශය)
  - විදෙන ලෙලෙන නරු බර..... (සැළලිහිණි සංදේශය)
  - ලකල පුළුලුකුල බඳමිණි මෙවුල්ලා......(සැළලිහිණි සංදේශය)
  - රූ රැසේ අදිනා ලෙසේ..... (ගුත්තිල කාව්‍ය)

*සාධක හතරක් නිවැරදිව නම් කිරීමට ලකුණු 04*

*විස්තර කිරීමට ලකුණු 04*

*මුළු ලකුණු 08*

3. දේශීය ශාන්තිකර්ම මගින් සමාජ සහජීවනය සඳහා මෙන්ම මනෝ චිකිත්සනය සඳහා ද උපදේශන සපයයි.

   (i) බලි ශාන්තිකර්ම හා බැඳුණු සමාජ විශ්වාස දෙකක් පැහැදිලි කරන්න.

- නවග්‍රහයින්ගෙන් ඇතිවන දෝෂ බලි ශාන්තිකර්මය මගින් දුරුවන බව
- ආතුරයාගේ ජන්ම පත්‍රයේ ග්‍රහ පිහිටීම අනුව ඇතිවන අපලවල ස්වභාවය අනුව ජන්ම පත්‍රය පරීක්ෂා කර බලා බලි ශාන්තිකර්ම කිරීමෙන් ඒ අපල දුරු වන බව
- ඇඹුම් බලි ගායනය අවසානයේ බලිය පුපුරා යෑමෙන් දොස් දුරුවන බව
- බුද්ධ, ධම්ම, සංඝ යන තෙරුවන් සහ නවග්‍රහයින් කෙරෙහි ඇති භක්තිමත් බව
- ග්‍රහයින්ට පමණක් නොව දෙවියන්ට, යකුන්ට, ප්‍රේතයින්ට පවා බලි පූජා පැවැත්වීම මගින් සෙතක් ශාන්තියක් උදාවන බව
- ඇස්වහ කටවහ දෝෂ බලි ශාන්තිකර්ම මගින් දුරුවන බව
- නියගය දුරලා වර්ෂාව ලබා ගැනීම සඳහා ද බලියාග සිදුකරන බව
- දරුවන් ලැබෙන්නට සිටින මව්වරුන්ගේ අයහපත් මනෝභාවයන් මෙන්ම අපහසුතා මගහරවා ආශිර්වාද ලබා ගැනීමට ගැබ් සෙත් බලිය කරන බව

*සමාජ විශ්වාස දෙකක් තෝරා ගැනීමට ලකුණු 02*

*සමාජ විශ්වාස දෙකක් පැහැදිලි කර ඇත්නම් ලකුණු 04*

*මුළු ලකුණු 06*

(ii) පහත සඳහන් කවි පාදය අවග්‍රහයෙන් ආරම්භ කර මැදුම් තනිතිතට ප්‍රස්තාර කරන්න.

"ධීර ගුණැති දීපංකර මුනි බුදු වෙමිනේ......"

| / | | | / | | | / | | | / | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 |
| + | ධී | ර | ගු | ණැ | ති | දී | - | පං | - | ක | ර |
| + | මුනි | බු | දු | වෙ | මි | නේ | - | - | - | - | - |

නිවැරදි විභාගවලට වෙන් කිරීම හා සංකේත භාවිතයට ලකුණු 02

කවි පදය නිවැරදිව ප්‍රස්තාර කිරීමට ලකුණු 04

මුළු ලකුණු 06

(iii) සුරපති වන්නමේ කස්තිරම හෝ ග්‍රහදණ්ඩ තාලය සින්දු වන්නමේ ඉරට්ටිය හෝ මේඝ වන්නමේ අඩව්ව හෝ ප්‍රස්තාර කරන්න.

උඩරට සුරපති වන්නමේ කස්තිරම

| ^ | | | / | | | | ^ | | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 |
| රෑ | ද | ග | ජිත් | - | ත | ක | ත | ක | ට | කුං | - | දත් | - |
| තග් | - | ග | ජිත් | - | ත | ක | ත | ක | ට | කුං | - | දත් | - |
| රෑ | ද | ග | ජිං | - | ජිං | - | රෑ | ද | ග | ජිං | - | ජිං | - |
| රෑ | ද | ග | ජිත් | - | ත | ක | ත | ක | ට | කු | ද | කු | ද |
| තග් | - | ග | ජිත් | - | ත | ක | ත | ක | ට | කුං | - | දත් | - |
| රෑ | ද | ග | ජිත් | - | ත | ක | ත | ක | ට | කුං | - | දත් | - |
| දෝං | - | - | තා | | | | | | | | | | |

නිවැරදි විභාගවලට වෙන් කිරීම හා සංකේත භාවිතයට ලකුණු 02

නිවැරදිව කස්තිරම ප්‍රස්තාර කිරීමට ලකුණු 06

මුළු ලකුණු 08

2. ශ්‍රී ලාංකේය නර්තන කලාව උදෙසා රාජ්‍ය අනුග්‍රහය ලැබී ඇති බව පුරාවිද්‍යා හා සාහිත්‍ය මූලාශ්‍ර මගින් හෙළි වේ.

(i) දුටුගැමුණු රජතුමා ආගමික කටයුතු සඳහා නර්තනය සහ වාදනය සම්බන්ධ කරගත් බවට මහාවංශය සහ ථූපවංශය ඇසුරින් **එක්** සාධකය බැගින් ගෙන පැහැදිලි කරන්න.

මහා වංශය

- දුටුගැමුණු රජතුමා රුවන්වැලිසෑය බඳින ස්ථානයට නළඟනන් 16000ක් පිරිවරාගෙන තූර්ය නාදය හා බෙර වයමින් ගිය බව.
- විජිතපුර සටන ජයගත් දුටුගැමුණු රජු එළාර රජුට ගෞරව දැක්වීම සඳහා සෙනග රැස් කිරීමට බෙර හැසිර වූ බව
- දුටුගැමුණු රජු මහා විහාරය සකස් කරන තැනට පැමිණි පසු නොයෙක් තූර්ය නාද සහිත දේව රාජයෙකු විලාසයෙන් පැමිණි බව.
- නිළියන් පිරිවරාගත් දුටුගැමුණු රජු කණ්ඩුල ඇතුපිට නැග ධාතු නිධාන උත්සවයට පිටත් වූ විට බෙර වාදනය කළ බව.
- දුටුගැමුණු රජු මහා සෑයේ ධාතු නිධාන උත්සවයේදී පූජාකල වස්තු අතර නිළි රූපයක් වූ බව

ථූප වංශය

- දුටුගැමුණු රජු රුවන්වැලිසෑය බඳින ස්ථානයට සුජාතා නම් දිව්‍යාංගනාව හා සමාන වූ සොළොස් දහසක් (නළඟනන් 16000ක්) නාටක ස්ත්‍රීන් පිරිවරා සක්දෙව් රජහුමෙන්.....
- ගැටබෙර, පණාබෙර, එකැස් බෙර, මද්දල, මිහිඟු බෙර, පටහ, ලොහො බෙර.... ආදී තූර්ය භාණ්ඩ වාදනය කල බව

සාධක දෙකක් නිවැරදිව තෝරා ගැනීමට ලකුණු 02
සාධක දෙක විස්තර කිරීමට ලකුණු 04
මුළු ලකුණු 06

(ii) මහා පරාක්‍රමබාහු රජතුමා නෘත්‍ය, ගීත ආදී විනෝදාංග සඳහා ද අනුග්‍රහය දක්වා ඇති බව මූලාශ්‍ර දෙකක් ඇසුරින් විස්තර කරන්න.

මහාවංශය, චූල වංශය

- මහා පරාක්‍රමබාහු රජතුමාගේ බිසව වූ රූපාවතී දේවිය නර්තනයෙහි දක්ෂ වූ බව හා තම හමුදාවේ සෙබළුන්ගේ ආශ්වාදය පිණිස නළඟන රැඟුම් පැවැත්වූ බව.
- මහා පරාක්‍රමබාහු රජතුමා කාව්‍ය ශාස්ත්‍ර, ගීත, නැටුම් ඉගෙනගත් බව
- මහා පරාක්‍රමබාහු රජතුමා නගර සැලසුම් කිරීමේ දී නෘත්‍ය ගීත විනෝදාංශ සඳහා නාට්‍ය ශාලා 5ක් ඉදිකරවූ බව.
- රන් ආලේපිතකල කුළුණුවලින් සහ චිත්‍ර පට සළුවලින් ද සරසන ලද "සරස්වතී මණ්ඩපය" සංගීත නැටුම් සඳහාම ඉදිකරන ලද බව.
- තම රජයේ උසස් කුලීන තරුණ තරුණියන් රජ මාලිගයේම රඳවාගෙන ඔවුන්ට සංගීත, නැටුම්, අත්කම්, රණ ක්‍රීඩා...... ආදිය පුහුණු කරවා චර පුරුෂ සේවයෙහි යෙදවූ බව.

මූලාශ්‍ර දෙකක් නිවැරදිව තෝරා ගැනීමට ලකුණු 02
මූලාශ්‍ර දෙක විස්තර කිරීමට ලකුණු 04
මුළු ලකුණු 06

(ii) ඌරා යක්කමෙන් සමාජ සහජීවනය සඳහා ලබාදෙන උපදේශන දෙකක් විමසුමට ලක් කරන්න.

- සමාජයේ තනි පුද්ගලයෙකු ලෙස ජීවත් විය නොහැකි බව
- සමාජයේ විවිධ තරාතිරමවල පුද්ගලයින් හා වෘත්තීය ස්වභාවයන් පිළිබඳ අවබෝධයෙන් කටයුතු කළ යුතු බව
  උදා : ඉසට ඉසලන්න ජගලත්තු තොප්පියක්.....
- සහයෝගයෙන් බෙදා හදා ගැනීම සඳහා ආදර්ශ ලබා දෙන බව
- කෘතගුණ සැලකිය යුතු ආකාරය පැහැදිලි කරන බව
- කුල දූරාවලියේ වගකීම් හා යුතුකම් විවරණය කරන බව

*උපදේශන දෙකක් නිවැරදිව ඉදිරිපත් කිරීමට ලකුණු 02*
*උපදේශන දෙකක් විමසුමට ලක්කර ඇත්නම් ලකුණු 04*
*මුළු ලකුණු 06*

(iii) සන්නියකුම ශාන්තිකර්මයෙන් මනෝ චිකිත්සනය සිදුවන අයුරු සන්නි චරිතයක් සහ යක්ෂ චරිතයක් ඇසුරින් විග්‍රහ කරන්න.

සන්නි චරිත

- වා, පිත්, සෙම් යන තුන්දෝෂයන් සන්නි චරිත මගින් පිළිබිඹු කර ඇති බව
- ඇප නූලක් බැඳීමෙන් ශාන්තිකර්මය පවත්වන තෙක් ආතුර මනස ශක්තිමත් කරන බව
- සන්නි යකුන් සහ ඇදුරාගේ සංවාද මගින් ලෙඩ රෝග ඇති වන ආකාරය හා දොස් පහ කරන ආකාරය පැහැදිලි කරන බව
- දෙබස්, ගායනා, වේශ භූෂණ, රංග භූමි අලංකරණ මගින් මනෝචිකිත්සනය

යක්ෂ චරිත

- ඇප නූල් බැඳීමෙන් යකුන්ගෙන් උවදුරු ඇති නොවන බව
- කළු, රීරි, සූනියම්, අභිමාන, තොට යන යකුන් වෙනුවෙන් පිදේනි ඔප්පු කිරීම මගින් දොස් පහවන බව
- සංවාද මගින් ආතුර මනස සුවපත් කරන බව (යක්ෂයා හා බෙර වාදකයා)
- ගායනය, වාදනය, වේශ භූෂණ හා රංග භූමි අලංකරණ මගින් මනෝ චිකිත්සනය සිදුවන බව
- සෙත් කරනු පිණිස ආරම්භයේ සිට අවසානය දක්වා "ආයුබෝ වේවා...." භාවිත වන බව
- ත්‍රිවිධ රත්නය හා දෙවියන්ගේ ආනුභාවයෙන් සියලු යකුන් දමනය වන බව

*සන්නි චරිතයක් හා යක්ෂ චරිතයක් නිවැරදිව තෝරා ගැනීමට ලකුණු 02*
*සන්නි චරිතයක් හා යක්ෂ චරිතයක් ඇසුරින් විග්‍රහ කිරීමට 3 X 2 ලකුණු 06*
*මුළු ලකුණු 08*

4. දේශීය ශාන්තිකර්ම විවිධ අරමුණු සාක්ෂාත් කරගැනීම උදෙසා ගොඩනැගී ඇත.

(i) කිරිමඩුව ශාන්තිකර්මයෙහි පූජාවිධි හතරක් නම් කර, ඉන් **එකක්** විස්තර කරන්න.

- තොටමෙට යාම
- දළ මුර පිදීම
- යහන් දැක්ම
- හත්පද පෙළපාළිය
- නූගේ හැල්ල හා මී කැඩීම
- ඇත් බන්ධනය
- කහගොටි පිදීම
- දේවාභරණ වැඩමවීම
- දේව කෝල් පාඩුව
- මල්පද නැටීම
- මුරුතැන් පිදීම
- මී බන්ධනය
- ආඩිගුරු නැටීම
- කිරි ඉතිරවීම

*පූජා විධි 4 නම් කිරීමට* *ලකුණු 02*
*ඉන් එකක් විස්තර කිරීමට* *ලකුණු 04*
*මුළු ලකුණු 06*

(ii) වලියක් මංගල්‍යය ශාන්තිකර්මයට ආවේණික විශේෂතා **තුනක්** පැහැදිලි කරන්න.

- මහනුවර විශ්ණු දේවාලයේ දී පමණක් පැවැත්වෙන බව
- සොළොස් මගල, ගවරමල සැකසෙන බව
- සිවිලිවලං භාවිතය
- වලියක් බත පිළියෙල කිරීම
- පරහඳ ගැම
- ඊකා වැලෙහි පඬුරු ගැට ගැසීම
- කාලි යෑම, කීල බැඳීම හා ගරා යකුන් නැටීම

*ආවේණික විශේෂතා තුනක් පැහැදිලි කර ඇත්නම්* *ලකුණු* $2 X 3 = 06$

(iii) රටයකුම ගෙවත් රිද්දි යාගයෙහි පෙළපාළි අංග **හතරක්** නම් කර උනුනු පියත භාවිත පෙළපාළි අංගයෙහි රංගභාණ්ඩ **දෙකක** උපයෝගිතාව විමසන්න.

පෙළ පාලි අංග

- තානු මූරය
- දරු නැළවිල්ල
- කපුයක්කාටිය
- කුමාර සමයම නැටීම
- හත්පද නැටීම
- රිද්දි සමයම නැටීම......

රංග භාණ්ඩ

- තානු තැටිය
- සබන් කැටය

* හචරිය
* කැඩපත....

*පෙළපාලි අංග හතරක් නම් කිරීමට* *ලකුණු 02*
*රංග භාණ්ඩ දෙකක් නම් කිරීමට* *ලකුණු 02*
*රංග භාණ්ඩ දෙකෙහි උපයෝගිතාව විමසුමට ලක්කර ඇත්නම්* *ලකුණු 04*
*මුළු ලකුණු 08*

5. ගැමි නැටුම් හා ගැමි නාටක මඟින් සිංහල හා දෙමළ ජනතාවගේ සංස්කෘතික අනන්‍යතා ප්‍රකට කෙරේ.

(i) සටන් කලාව හා බැඳුණු සිංහල ගැමි නැටුමක් සහ ඊට සමාන ද්‍රවිඩ ගැමි නැටුමක් පිළිබඳ විස්තර කරන්න.

ලී කෙළි නැටුම

* යුද්ධ අභ්‍යාස ක්‍රම ඇසුරෙන් නිර්මාණය වී සැකසුණු ජන නර්තනයක් බව.
* පැරණි නර්තන ක්‍රමයක් වන අංගම්පොර සටන් කලාව ඇසුරෙන් ප්‍රභවය වූ බව
* නර්තන චලනවල ප්‍රති ප්‍රහාර එල්ල කිරීම, පහර වැළැක්වීම, වේගය, ජවය, තාණ්ඩව ලක්ෂණ දක්නට ඇති බව.
* ඇම්බැක්කේ දේවාලයේ බාල්කයක ලී කෙළි නැටුමේ කැටයමක් දක්නට ඇති බව.
* ලී කෙළියෙහි විශේෂ අවස්ථාවක් ලෙස ලී මල්ලිය දැක්විය හැකි බව.
* සංස්කෘතික අනන්‍යතාවක් ලෙස සාමූහිකත්වය, ඇඳුම් පැළඳුම්, ඇදහිලි විශ්වාස, ගායනය, වාදනය ප්‍රකට බව

කෝලාට්ටම්

* ''සෙව්වායිමියර් කෝලාට්ටම්'' යනුවෙන් ද කෝලාට්ටම් හඳුන්වන බව.
* ද්‍රවිඩ ගැමි ජනයා හා බැඳුණු ජන නර්තනයක් බව.
* කෙටි ලී දෙකක් ගෙන වෘත්තාකාරව ගමන් කරමින් නර්තනය කරනු ලබන බව.
* කෝලාට්ටම නර්තනයේ විශේෂ අවස්ථාවක් ලෙස පින්නල් කෝලාට්ටම් දක්නට හැකි බව.
* සංස්කෘතික අනන්‍යතා ලෙස සාමූහිකත්වය, රංගවස්ත්‍රාභරණ, ඇදහිලි විශ්වාස, ගායන, වාදනය, සරල අංගරචනය මෙම නර්තනයේ ප්‍රකට වන බව.

*ගැමි නැටුම් දෙක නිවැරදිව තෝරා ගැනීමට* *ලකුණු 02*
*ඉහත කරුණු ඇසුරෙන් සිංහල හා දෙමළ ජනතාවගේ සංස්කෘතික*
*අනන්‍යතා විස්තර කර ඇත්නම්* *ලකුණු 2+2 = 04*
*මුළු ලකුණු 06*

(ii) "දෙමළ ගැමි නර්තන, දේව භක්තිය ප්‍රකාශ කිරීම ප්‍රමුඛ කොටගෙන පවත්වනු ලැබේ." කාවඩි සහ කරගම් නර්තන ඇසුරෙන් විමසන්න.

කාවඩි

* මුරුගන් හෙවත් ස්කන්ධ දෙවියන් වෙනුවෙන් කරන පූජා නර්තනයක් බව.
* කෝවිල් ආශ්‍රිතව දියුණු වූ ජන කලාවක් බව.
* කාවඩි නර්තනය නිර්මාණය වීම සඳහා සුරාසුර යුද්ධය සම්බන්ධ කථා ප්‍රවෘත්තිය පාදක වී ඇති බව.

- සිරි කාවඩි, භක්ති කාවඩි, පරවි කාවඩි, මත්ස්‍ය කාවඩි, ගිනි කාවඩි ලෙස කාවඩි ප්‍රභේද ඇති බව.
- කතරගම දේවාල පෙරහැර, වෙල් පෙරහැර, හින්දු ආගමික පූජෝත්සවවල දී සහ භාරහාර ඔප්පු කිරීම සඳහා කාවඩි නර්තනය සිදුකෙරෙන බව.
- වාදනය සඳහා තවිල් බෙරය හා නාගස්වරම් යන වාද්‍ය භාණ්ඩ යොදා ගන්නා බව.

කරගම්

- කාලි, අයියනාර්, මුරුගන් ආදි දෙවිවරු වෙනුවෙන් ඉදිරිපත් කරනු ලබන බව.
- මාරි අම්මාන් (පත්තිනි) දේවතාවිය වෙනුවෙන් ද කරනු ලබන බව.
- දේව භක්තිය ප්‍රකාශ කිරීම / නියගය වළක්වා වර්ෂාව ලබා ගැනීම වෙනුවෙන් කරනු ලබන බව.
- කරගම් නර්තනයේ ආවේණික ලක්ෂණ ලෙස කළයක් හිසමත තබා සමබර කරමින් නර්තනයේ යෙදෙන බව.
- තවිල් බෙරය, (මෝලම), නාගස්වරම් ශබ්ද පූජා නර්තනයට එක්වන බව.
- කරගම් වර්ග ලෙස අට්ට කරගම් සහ ශක්ති කරගම් ඇති බව.

*කරුණු තුනක් මගින් දේව භක්තිය ප්‍රකාශ කිරීම සඳහා*

*සංස්කෘතික අනන්‍යතා විස්තර කර ඇත්නම් එක් කොටසකට ලකුණු 2 X 3 = 06*

*මුළු ලකුණු 06*

(iii) මුදලි සහ ජස කෝලම් චරිත ඇසුරින් තත්කාලීන සිංහල ගැමි සමාජ පසුබිම පිළිබඳ විග්‍රහ කරන්න.

මුදලි

- ප්‍රභූ පන්තිය නියෝජනය කරන බව
- රාජකාරිය පැහැර හරින බව
- උඩඟුකම හා මාන්නාධික බව.
- අල්ලසෙහි යෙදෙන බව
- ස්ත්‍රී ලොල් බව.
- අසාධාරණ ලෙස තීන්දු ලබා දෙන බව.

ජසයා

- කුලහීන පන්තිය නියෝජනය කරන බව.
- සුරාවෙහි ලොල් බව
- අඹු සැමි සබඳතාවන්හි ඇති සට්ටන හා පවුල් සංස්ථාවේ ඇති නොසන්සුන් බව
- බහු විවාහකයෙකු බව
- බයාදු බව මෙන්ම, උඩඟුකම, ආත්ම වර්ණනාව

*මුදලි සහ ජසයා යන චරිත පිළිබඳ කරුණු හතර බැගින් විස්තර කර ඇත්නම් ලකුණු 4 + 4 = 08*

*මුළු ලකුණු 08*

**6. පහත වගුවෙහි (අ), (ආ) සහ (ඉ) යන කොටස් ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(i) (අ) කොටස - **භරත නාට්‍යම් නර්තන සම්ප්‍රදායේ භාවිත තාල වාද්‍ය භාණ්ඩය තෝරාගෙන ඒ පිළිබඳ විස්තර කරන්න.**

මෘදංගය

- භරත නාට්‍යම් සම්ප්‍රදායේ ප්‍රධාන අවනද්ධ භාණ්ඩය බව.
- දකුණු ඉන්දියානු කර්ණාටක සංගීත සම්ප්‍රදායට අයත් ආනත වර්ගයේ වාද්‍ය භාණ්ඩයක් බව.
- පැරණි හින්දු කෝවිල්වල වාදනය කර ඇති බව.
- කොස්, ඇහැල වැනි ලී වර්ග බෙරයේ කඳ සඳහාත්, බෙර ඇස සඳහා එළුහම් ද යොදා ගන්නා බව.
- මෘදංගයේ තා, දිම්, තෝම්, නම් යන මූලික අක්ෂර වාදනය කෙරෙන බව.
- දිග අඟල් 18 - 20 වන අතර විෂ්කම්භය වම්පස අඟල් 8 - 10ක්ද, දකුණු පස අඟල් 8ක් ද වන බව.
- දකුණු ඇසට ස්ථිර කළු බදාමයක් යොදා ගන්නා බව.

*වාද්‍ය භාණ්ඩය තෝරා ගැනීමට ලකුණු 02*
*කරුණු හතරක් ඇසුරෙන් විස්තර කිරීමට ලකුණු 04*
*මුළු ලකුණු 06*

(ii) (ආ) කොටස - **2014 වර්ෂයේ නිෂ්පාදනය කළ දේශීය මුද්‍රා නාට්‍ය තෝරාගෙන එහි චරිත නිරූපණය පිළිබඳ විමසීමට ලක්කරන්න.**

පටාචාරා

- තාරා කුමරිය (පටාචාරා), දාරක ප්‍රධාන චරිත වන බව.
- තාරා කුමරියගේ කුඩා කාලයේ චරිත නිරූපණය සඳහා කුම්මි නැටුම, භරත නාට්‍යම්වල චලන යොදා ගෙන ඇති බව.
- තරුණ අවධියේ චරිත නිරූපණය සඳහා භාරතීය නර්තන (භරත/ කථක්) නර්තන චලන යොදා ගත් බව
- තාරා කුමරිය දාරක හා පෙමින් බැඳෙන ආකාරය දැක්වීමේ දී බටහිර බැලේ සහ නිදහස් රංග රීතිය යොදා ගත් බව.
- පටාචාරාගේ සිහිවිකල් බව නිරූපණයේ දී නිදහස් චලන යොදා ගෙන ඇති බව.
- දේශීය ගැමි නැටුම්වල සරල චලන යොදා ගෙන ඇති බව.
- උඩරට වන්නම්වල නාදමාලා අනුව නර්තන චලන යොදාගෙන තිබීම.
- පෙරඅපර දෙදිග සංගීත ඛණ්ඩ සංයෝජනය කරගනිමින් භාරතීය, බටහිර හා දේශීය නර්තන ශෛලීන් ඇසුරෙන් චරිත නිරූපණය සිදුකර ඇති බව....
- චරිත නිරූපණය සඳහා අංග රචනය හා වේශ භූෂණ යොදා ගෙන ඇති බව

*මුද්‍රා නාට්‍ය තෝරා ගැනීමට ලකුණු 02*
*චරිත දෙකක් නිරූපණය පිළිබඳ විමසීමට ලක්කර ඇත්නම් ලකුණු 04*
*මුළු ලකුණු 06*

(iii) (ආ) කොටස - 1890 වර්ෂයේදී ප්‍රථමවරට වේදිකාගත වූ බැලේ (Ballet) කෘතිය තෝරාගෙන එහි ප්‍රධාන කාන්තා චරිතය පිළිබඳ විමසන්න.

නිදි කුමරිය (Sleeping Beauty)

අවුරෝරා කුමරිය

- රුසියාවේ නිෂ්පාදනය කළ බැලේ කෘති අතර, මාරියස් පෙටිපා විසින් රංග රචනය කළ අග්‍රගණ්‍ය නිර්මාණයක් බව.
- රොමැන්ටික් ආකෘතිය අනුව නිර්මාණය වූ මෙම කලාකෘතියේ ප්‍රධාන කාන්තා චරිතය අවුරෝරා කුමරිය බව
- රජුගේ දියණිය වූ මැය Rare Adag සඳ නැමති ඉතා සංකීර්ණවූත්, අලංකාරවූත් නර්තනයෙහි දක්ෂතා ඇති බව.
- අවුරෝරා කුමරියගේ චරිතය, රාජධානියේ හදවතට සමාන කර ඇති බව.
- කුමරිය Desire කුමරුට විවාහ කරදීම නිසා උත්සවයක් පැවැත් වූ බව.
- කුමරා සහ කුමරිය Pas de Dent යන අසිරු නර්තනයක යෙදුනු බව

*කෘතිය නම් කිරීමට ලකුණු 02*

*කාන්තා චරිතය විමසීමට ලක්කර ඇත්නම් ලකුණු 06*

*මුළු ලකුණු 08*

7. නර්තන කලාව සහ අනෙක් සෞන්දර්ය කලා අතර ඇති සහසම්බන්ධතාව නිර්මාණකරණයේ දී වැදගත් වේ.

(i) ප්‍රාසංගික නර්තන නිර්මාණ සඳහා සංගීතයෙන් ලැබෙන පිටිවහල පිළිබඳ සාකච්ඡා කරන්න.

- දේශීය ජන සංගීතය, භාරතීය හා බටහිර සංගීතය යොදා ගන්නා බව
- ශාන්තිකර්ම හා දේශීය ගැමි නැටුම්හි භාවිත ගායනය, නාදමාලා, නැටුම් අංග යොදා ගන්නා බව
- දේශීය වාද්‍ය සංගීත භාණ්ඩ නර්තන නිර්මාණ සඳහා සමෝදානය කරගන්නා බව
- භාරතීය වාද්‍ය භාණ්ඩයන්හි ධ්වනිය නර්තනාංග සඳහා භාවිතා කර ඇති බව
- ප්‍රාසංගික නර්තන නිර්මාණ සඳහා සුභාවිත සංගීතය නවාංගයක් ලෙස යොදා ගන්නා බව
- බටහිර සංගීත භාණ්ඩවල හඬ මගින් නර්තන නිර්මාණවල ප්‍රාසංගික ගුණය ජනිත වන බව
- පටිගත කළ සංගීත ඛණ්ඩ යොදා ගන්නා බව
- දේශීය මුද්‍රා නාට්‍ය සඳහා පෙරඅපර දෙදිග සංගීතයේ දායකත්වය ලැබෙන බව

*කරුණු තුනක් ඇසුරෙන් සංගීතයෙන් ලැබෙන පිටිවහල සාකච්ඡා කර ඇත්නම් ලකුණු 2 X 3 =06*

(ii) **නර්තන නිර්මාණකරණය සඳහා චිත්‍ර කලාවේ මූලිකාංග භාවිත කළ හැකි ආකාරය විමසුමට ලක් කරන්න.**

- චිත්‍ර කලාවේ ප්‍රධාන මාධ්‍යයන් වර්ණ, රේඛා, හැඩතල, සෘජුවම නර්තනයට බලපාන බව
- ඇඹීම, ඇඳීම, කැටයම් කැපීම, තෙලීම, වර්ණ ගැන්වීම විවිධ රේඛා හැඩතල මෝස්තර නර්තන කලාවට බෙහෙවින් උපයෝගී කර ගන්නා බව
- රංග වස්ත්‍රාභරණ, රංග උපකරණ, පසුතල නිර්මාණ, රංග භූමි අලංකරණය සඳහා යොදා ගන්නා බව
- ශාන්තිකර්ම රංග වස්ත්‍රාභරණයන්හි වර්ණ රේඛා හැඩතල ඉස්මතු වන බව
  උදා : වෙස් ඇඳුම් කට්ටලය.... තෙල්මෙ, වඩිග පටුන, ලිච්ඡවී.... පබළු ඇඳුම් කට්ටලය ආදී
- රංගාලෝක සැලසුම් කිරීමේදී වර්ණ ගැලපීම පිළිබඳ අවධානය යොමු කළ යුතු බව
  උදා : වර්ණ චක්‍ර, වර්ණ ගැලපීම, උණුසුම් වර්ණ, ශීත වර්ණ
- අංග රචනය සිදුකිරීමේදී රේඛා වර්ණ හැඩතල භාවිත වන බව

2x3

*කරුණු තුනක් ඇසුරෙන් විමසුමට ලක් කර ඇත්නම් ලකුණු ~~3 X 2~~ = 06*

(iii) බටහිර බැලේ සහ නෘත්‍ය නාටකවල සමවිමෙතා සංගීතය සහ ඇඳුම් පැලඳුම් යන අංග ඇසුරෙන් ඇගයීමට ලක් කරන්න.

සංගීතය

- බටහිර බැලේ නර්තනයේ සහ නෘත්‍ය නාටකවල සංගීතය මූලික ප්‍රකාශන මාධ්‍යයක් වන බව
- බැලේ සඳහා බටහිර ශාස්ත්‍රීය සංගීත සම්ප්‍රදාය යොදා ගන්නා බව
- නෘත්‍ය නාටක සඳහා කර්ණාටක සහ හින්දුස්ථානී සංගීත සම්ප්‍රදායයන් සහ භාරතීය ජන සංගීතය යොදා ගෙන ඇති බව
- බැලේ නර්තනය සඳහා රිද්මයානුකූල සංගීතය භාවිතවන අතර නෘත්‍ය නාටක සඳහා වැඩි වශයෙන් තාලානුකූල සංගීතය භාවිතවන බව
- බැලේ නර්තනය සඳහා පියානෝව ප්‍රධානව වාද්‍ය භාණ්ඩ රාශියක් භාවිතවන බව
- බැලේ සඳහා සංධ්වනි සංගීතය යොදා ගන්නා අතර නෘත්‍ය නාටක සඳහා සංගීත ශිල්පීන් කිපදෙනකු විසින් සංගීතය සපයන බව
- බැලේ සඳහා අවම වශයෙන් තාල වාද්‍ය භාණ්ඩ යොදා ගන්නා අතර නෘත්‍ය නාටක සඳහා තාල වාද්‍ය භාණ්ඩ විශාල ප්‍රමාණයක් යොදා ගන්නා බව
  උදා : තබ්ලාව, පඛ්වාජ්, මෘදංගය, කෝල් බෙරය

ඇඳුම් පැලඳුම්

- බටහිර බැලේ නාට්‍යයන්හි චරිතයේ ස්වභාවය අනුව ඇඳුම් පැලඳුම්වල සුළු වශයෙන් වෙනස්වන අතර නෘත්‍ය නාටකවල දී බහුල වශයෙන් දැකිය හැකි බව.
- බටහිර බැලේ නාට්‍යයන්හි ඇඳුම් පැලඳුම් සඳහා වැඩි වශයෙන් සුදු සහ කළු වර්ණ භාවිත වන අතර නෘත්‍ය නාටකවල දී විචිත්‍ර වර්ණ භාවිත වන බව

- බටහිර බැලේ නාට්‍ය සඳහා සරල දුහුල් ඇඟට ඇලුණ රංගවස්ත්‍රාභරණ භාවිත වන අතර (කොට සාය, ලියෝටාඩ්) නෘත්‍ය නාටක සඳහා උත්තර, දක්ෂිණ භාරතීය ආභාසය ඇතිව රංගවස්ත්‍රාභරණ නිර්මාණය කර ඇති බව
- බටහිර බැලේ සඳහා ඊට ආවේණික සපත්තු (ස්කල්ෆෙ) විශේෂයක් පලදිනු ලබන බව (මේස් පාවහන්, සපත්තු පැලදී)

*අවම වශයෙන් කරුණු හතරක් බැගින් යොදා ගනිමින්*
- *සංගීතය ඇසුරින් සම විෂමතා ඇගයීමට ලක් කිරීමට* *ලකුණු 04*
- *ඇඳුම් පැලඳුම් ඇසුරින් සම විෂමතා ඇගයීමට ලක් කිරීමට* *ලකුණු 04*

*මුළු ලකුණු 08*

8. (i) රියැලිටි වේදිකාවේ ඉදිරිපත් කරන කණ්ඩායම් නර්තන මගින් දේශීය අනන්‍යතාව සුරැකේ ද? විමසන්න.

- රියැලිටි වැඩසටහන්
  - සුපර් ස්ටාර්
  - ~~ඩ්‍රීම් ස්ටාර්ස්~~ little star දෙරණ
  - වේදිකා ප්‍රසංග
  - සංගීත සංදර්ශන
  - පෞද්ගලික නර්තන ප්‍රසංග
  - ජාතික හා අන්තර් ජාතික වැඩසටහන්

Hiru Step up
Hiru Super Dance
Kavitha

- ඉහත නර්තන නිර්මාණ සඳහා යොදාගෙන ඇති,
  - නර්තන/ චලන
  - සංගීතය
  - ගායනය
  - වාදනය
  - රංග වස්ත්‍රාභරණ
  - අංග රචනය යනාදි කරුණු ඇසුරින් දේශීය අනන්‍යතාවය සුරැකේද යන්න විමසීමට ලක් කර ඇත්නම්

*රියලිටි වැඩසටහන් 4 නමකර ඇත්නම්* *ලකුණු 02*
*දේශීය අනන්‍යතාවය විමසීම සඳහා* *ලකුණු 04*
*මුළු ලකුණු 06*

(ii) විසිඑක්වන සියවසේ ශ්‍රී ලාංකේය නර්තන කලාව කෙරෙහි කාන්තා දායකත්වය කෙබඳු ද? ඔබේ අදහස් දක්වන්න.

- විසි එක්වන සියවසේ යුග පරිවර්තනයක් සමග පුරුෂයින් අභිබවා නිර්මාණකරණය සඳහා කාන්තා දායකත්වය වර්ධනය වී ඇති බව.
- පාසල් නර්තන අධ්‍යාපනය විධිමත් වීම, විශ්වවිද්‍යාල අධ්‍යාපනය දක්වා පුළුල් වීම හේතුවෙන් නර්තන ශිල්පිනියන්, ගුරුවරියන් වශයෙන් වෘත්තිමය තත්ත්වයට පත්වී ඇති බව.

- ප්‍රාසංගික වේදිකාව හා මංගල උත්සව සඳහා කාන්තා නර්තන කණ්ඩායම් බිහි වීම නව ප්‍රවණතාවක් බව.
- කාන්තා කළඑලි රංගන සඳහා ශීර්ෂාභරණ පැළඳවීම ඉහළ ජනප්‍රියත්වයට පත්වී ඇති බව
- කාන්තාවන් සඳහා නර්තන ක්ෂේත්‍රයේ විවිධ උසස් තනතුරු දැරීමට අවස්ථාව ලැබී ඇති බව
- මුද්‍රා නාට්‍ය නිර්මාණය සඳහා කාන්තා දායකත්වය ලැබී ඇති බව.
- බෙර වාදනය සඳහා කාන්තාවන් නැඹුරුවී ඇති බව.

*අවම වශයෙන් කරුණු තුනක් ඇසුරෙන් කාන්තා දායකත්වය පිළිබඳ අදහස් දක්වා ඇත්නම්*

*ලකුණු 2 X 3 = 06*

(iii) නූතන නර්තන කලාව පිළිබඳ විමසීමේ දී, දේශීය සංස්කෘතික ලක්ෂණ අභිබවා බටහිර සංකල්පීය ලක්ෂණ ස්ථාපිත වීම කෙරෙහි ජනමාධ්‍ය බලපා ඇත. විචාරය කරන්න.

- ජන මාධ්‍යයන්හි විකාශනයවන නර්තන වැඩසටහන් නම් කර තිබේනම්
  උදා : හිරු සුපර් ඩාන්ස්, දෙරණ ලිට්ල් ස්ටාර්, සිරස ඩාන්සින් ස්ටාර්
- ශ්‍රව්‍ය, දෘශ්‍ය මාධ්‍ය මගින් ඉදිරිපත් කරන නර්තන අංගවල දැකිය හැකි බටහිර රංග ශෛලීන් අනුගමනය කර ඇති ආකාරය පිළිබඳ විස්තර කර තිබේනම්
  උදා : බටහිර බැලේ. SALSA. SAMBA. Hippop. JAZZ. SUMBA
- රංග විස්තාරණ, අංගචලන, වේග නිරූපණය සඳහා උදාහරණ දක්වා තිබේනම්
- නිදහස් චලන සහිත නර්තන අංග බිහිවීමේ ප්‍රවණතාවය දක්වා තිබේනම්

*කරුණු හතරක් ඇසුරෙන් ජන මාධ්‍යයට බලපා ඇති අයුරු විචාරය කර තිබීම*

*ලකුණු 2 X 4 = 08*



PARCEL NO
LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්
PADANAMA PUBLICATION
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සුහද
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න